


13වන කොටස

අමන්දි ගේ කළමණා මල්ලත් ඊසලයත් ඔසවාගෙන කුඩා කඳුගැටය නැග්ගේ විශ්වජිත් ය.

"ඔච්චර හයියෙන් දුවන්න එපා.." අමන්දි දෙවතාවක්ම කීවා ය. ඈ ගමන් කරමින් සිටියේ ඔහුට වඩා බොහෝ පසු පසින් ය. "..මට මහන්සියි.."

ඔහු කඳු ගැටය මත සිට සිනාසෙමින් බලා සිටියේ ය.

"හෙමින් එන්න.." ඔහු කීවේ ය. ඇය තමා වෙත ළං වූ විට ඔහු අත දිගු කර ඇගේ අත අල්ලා ගත්තේ ය. ඈ ඔහුගේ අතට බර දී කඳු ගැටය මතට ගොඩ වූවා ය.

"ජේනවද අර ඈත තියෙන පුංචි කන්ද..?" ඔහු ඇසුවේ ය. ඈ ඔහු අත දිගු කළ ඉසව්වේ වූ කන්ද දෙස බැලුවා ය. ඒ කඳු මුදුනෙහි එකම එක ගසක් තිබෙනු ඇය දුටුවා ය.

"ඔයා ගුරු ගීතය කියවලා තියෙනව නේද..? චිංගීස් අයිත්මාතව් ගෙ ගුරු ගීතය.. දුයිෂෙනුයි අල්තිනායි එකට එක්වෙලා ගුරු ගෙදර ළඟ කන්දෙ හිටවපු පොප්ලර් ගස් දෙක මතකද..? ඒ වගේම ගස් දෙකක් ඔය කන්ද උඩත් තිබුණා.. මං ඉස්සර මෙතනට ආවම ඒ දිහා බලන් ඉන්නවා.. මට ඒ වෙලාවට ගුරු ගීතය මතක් වෙනවා.. දුයිෂෙන් මතක් වෙනවා.." ඔහු මිමිණුවේ ය. ".. ඒත් කාලෙකට පස්සෙ එක ගහක් මැරුණා.. "

ඈ හැරී ඔහුට මුහුණ ලා සිටගත්තා ය.

"ඇත්ත කියන්න.. ඔයාට අල්තිනා මතක් වුණේ නැද්ද..? කව්ද ඔයාගෙ අල්තිනා..? ගුරුතුමාට හිත යටින් ආදරය කළ අල්තිනා.. "

ඔහු පිළිතුරක් නොදී කඳු මුදුනෙහි වූ එකම ගස දෙස බලා සිටියේ ය.

"මගේ ජීවිතේ අල්තිනා කෙනෙක් නැහැ අමා.." ඔහු බොහෝ වේලාවකට පසු කීවේ ය.

"බොරුකාරයා.." අමන්දි කීවා ය. "...ඔයාට මතකද..? පොතේ අල්තිනා තමන්ගෙ ආදරය ප්‍රකාශ කරලා දුයිෂෙන්ට ලියුමක් එවනවා.. ඒත් දුයිෂෙන් ඒක නොදැක්කා වගේ හැංගෙනවා.. ඔයත් ඒ වගේ.."

ඔහු ඇය දෙස බැලුවේ අමනාපය රැඳුණ ඇසිනි.

"කා ගැනද ඔයා මේ කියන්නෙ..?" ඔහු ඇසුවේ ය. ඈ සිනාසෙමින් බලා සිටියා ය. " ..කියන්න.." ඔහු නැවත කීවේ ය.

"ශාමිලා ගැන.." අමන්දි ගේ වදන් විශ්ව ගේ සිත මොහොතකට වික්ෂිප්ත කළේ ය. " ...ඔයාට හිත යටින් ආදරය කරන අල්තිනා ගැන.. ඔයා මා ළඟට වෙලා අඳින්න කියා-දෙනකොට ඒ ළමයගේ ඇස්වල උතුරණ හැඟීම ඔයා දැකල තියෙනව ද? මං හොඳට දැකලා තියෙනවා.. ඔයත් නොදකින්න විදිහක් නැහැ විශ්ව.."

විශ්ව ඈතින් පෙනෙන නිල් කඳු පෙළ දෙස බලා සිටියේ ය. ශාමිලා පිලිබඳ අමන්දි කියන ආකාරයේ හැඟීමක් - දයාබර ශිෂ්‍යාවක සහ දැඩි කැපවීමකින් ශිල්ප කියාදෙන ගුරුවරයකු අතර ඇති බැඳීමකට වඩා ඈතට ගිය හැඟීමක් - කිසි දිනෙක තම සිත තුළ තිබුණි ද? විශ්ව සිතුවේ ය.

"පිස්සු කතා කියන්න එපා.." ඔහු හිස සැලුවේ ය. ".. ඒ ළමයා අහිංසක පුංචි ළමයෙක්.. මගේ හොඳම ශිෂ්‍යාවක්.. ශිෂ්‍යාවක් විදිහට එයා මට ආදරෙයි.. මගේ දුක සැප හොයලා බලනවා.. එච්චරයි.. ඔහු රාමු කළ කැන්වසය-ක් ඊසලය මත සවි කළේ ය. .. ඔය කතාව නවත්තලා වැඩ පටන් ගන්න.. අච්ච වැටුණොත් වැඩක් නෑ.."

අමන්දි අක්‍රමවත් තීන්ත පහර කීපයකින් කැන්වසය මත කන්දේ හැඩ තල මතුකළා ය. කන්දට ඔබ්බෙන් ක්ෂිතිජ රේඛාවේ වූ නිල් අලු පැහැති භූමිය ක්‍රමයෙන් මතු කර ගත්තා ය. විශ්ව ඇයට බාධා නොකර ඈත සිට බලා සිටියේ ය. එකම ගසක් හෝ නැති කන්ද ඇගේ සිත්තමේ මැද සුවිසල් පාලුවක් ඇති කරමින් නැගී සිටිනු ඔහු දුටුවේ ය.

"ඇයි ඒ ගහ අඳින්නෙ නැත්තෙ ..?" ඔහු සෑහෙන වේලාවකට පසු ඇසුවේ ය.

"අඳිනවා.. අන්තිමට... මං මේ ජේන්ටිං එක ඉවර කරන තුරු ඒ ගහ එතැනම තිබුණොත් මං ඒක අඳිනවා..." ඈ මුරණ්ඩු ස්වරයකින් කීවා ය.

"පිස්සි.. මේ පොඩි වෙලාවකට ඒ ගහට මොනවා වෙන්නද?"

"කවුද දන්නෙ..? ඔයාමනෙ කිව්වෙ කලින් එතැන ගස් දෙකක්ම තිබුණා කියල .. දැන් එක ගහයි.. කවුද දන්නෙ ඒ ගහත් තව කොයිතරම් කාලයක් තියෙයිද කියල ..? අමතක කරන්න එපා මාස්ටර් මං මේ අඳින්නෙ මගේ ජේන්ටිං එක.. ඒක ඔයාගෙ හිතේ තියෙන එකට වඩා වෙනස් විදිහට දකින්න වෙනස් විදිහකට අඳින්න මට පුලුවන්.." අමන්දි තීන්ත තැවරුණ පින්සල අතැතිව විශ්ව දෙස හැරී බැලුවා ය. ".. අපි දකින අපි විඳින මේ හැම දෙයක්ම තාවකාලිකයි විශ්ව.." ඈ කීවා ය. අවසන් වාක්‍යය ඔහුට නෑසෙන්නට ඇතැයි ඇයට සිතුණි. ඒ මොහොතේ ඔහු ඇය කියන්නක් නෑසුණා සේ ඇයට පිටුපා අඩි පාර ඔස්සේ පියවර කීපයක් ඈතට යමින් සිටියේ ය.

ඇගේ නළලත නැගී තිබූ ඩා බිඳු ඔහු නොදුටුවේ ය. තම ගත පුරා පැතිර යන වේදනාව ඔහුගෙන් වසන් කරගන්නට හැකි වීම අමන්දි ගේ සිතට මඳ සහනයක් ලබා දුන්නේ ය. අත්බෑගයෙන් වේදනා නාශක පෙති දෙකක් ගත් අමන්දි විශ්ව දකින්නට පෙර ම එය ගිල දැම්මා ය.

විශ්ව හැරී බලන විට අමන්දි සිටියේ බිම වාඩි වී දෙදණ මත හිස තබාගෙන ය.

"අමා.." ඔහු ඇය අසළින් වාඩි වූයේ ය. ඈ ඔහුගේ උරහිස මත සිය හිස තබාගත්තා ය. ඇගේ මුහුණ පුරා මතුව තිබූ ඩා බිඳු වල සිසිලස ඔහුගේ උරහිස මත තැවරුණි. ඇය අපහසුවෙන් හුස්ම ගනු ඔහුට දැනුණි.

"හුගක් අමාරුද..?" ඔහු ඇසුවේ ය.

"නැහැ.." ඈ වහා කීවා ය. ".. ඒ හැටි අමාරුවක් නැහැ.. පොඩ්ඩක් මහන්සි දැනුණා.. මෙහෙම ටිකක් ඉන්නකොට හරි යයි.."

විශ්වජිත් සිනාසුණෝ ය. අමන්දී කීවේ සත්‍යය නොවන බව ඔහු දනියි. එනමුදු ඇගේ ඒ ධෛර්යයට ඔහු කැමති වූයේ ය.



රෝගය හමුවේ දිරියෙන් නැගී සිටින්නට ඇය දරණ උත්සාහය ඔහු සිතේ ඇති කළේ ප්‍රසාදයකි. ඇය සැමදාම එහෙමම ය. මේ සටනින් පහසු පරාජයක් ලබා සැනසෙන්නට ඇය අකමැති බව ඔහු දනියි.

"අමා.." විශ්ව ඈත ක්ෂිතිජය දෙස බලාගත්වන ම ඇය ඇමතුවේ ය. ඇය නිහඬව අසා සිටියා ය. ".. මට ඔයාට කියන්න කාරණයක් තියෙනව.."

"කියන්න.." ඈ සිටි ඉරියව්ව වෙනස් නොකර ම කීවා ය.